මධ්‍යම පළාත් සභාව - 2023 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශීර්ෂ 580 කර්මාන්ත අමාත්‍යාංශයට අදාළව කෙරීගෙන යන වැඩ ගිණුමට සමාලෝචිත වර්ෂය තුළ රු.28,675,000 ක් හර කර තිබුණ ද ඊට අදාළ සංචිත ගිණුමේ වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු පිළිබඳ කිසිදු සටහනක් දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) පළාත් සභාවේ ආයතන 05 ක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.46,106,500 ක වාහන 23 කට අදාළ ලේඛන, ලිපිගොනු, අයිතිය තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා ඵලදායීව සත්‍යාපනය කිරීමට නොහැකි විය. | වාහන 23 හි වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු සපයා ඇත. | වාහනවල අයිතිය තහවුරු කෙරෙන ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මධ්‍යම පළාත් සභාවේ වාහන 05 ක අගය දෙවරක්, ආයතන 06 ක මූල්‍ය ප්‍රකාශනවල රු.57,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | • වාහන 03 ක් ආයුර්වේද කොමසාරිස් නමට පවරාගෙන, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගිණුම්ගත කර ඇති බව<br>• කර්මාන්ත අමාත්‍යාංශයට අයත් තාවකාලිකව ප්‍රධාන ලේකම් වෙත ලබා දී තිබුණු වාහනය ප්‍රධාන ලේකම් කාර්යාලයේ ද ගිණුම්ගත කර ඇති බැවින් කර්මාන්ත අමාත්‍යාංශය ගිණුම්වලින් ඉවත් කළ බව.<br>• එක් වාහනයක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගිණුම්ගත වී ඇති බව | ද්විගණනය වී තිබුණු ආයතන විසින් ගිණුම්ගත කිරීම සහ ඉවත් කිරීම් තහවුරු කළ යුතුය. |
| (ඇ) 2011 සිට 2015 අතර කාල පරිච්ඡේදයේ දී රු.7,236,595 කට මිලදී ගෙන තිබුණු ජීප් රථයක් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල රු.3,400,000 ක් ලෙස රු.3,836,595 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | නිවැරදි වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) බලපත්‍රලාභීන් 34 දෙනෙකුගෙන් ලබාගෙන තිබුණු රු.3,400,000 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල්, තැන්පත් ගිණුමක රඳවා ගැනීම වෙනුවට ආදායම් ගිණුමේ 1003-07-10 - බඩු උකස් ගන්නන්ගෙන් අය කරන ගාස්තු අය ශීර්ෂයට බැර කිරීම නිසා වර්ෂයේ ආදායම රු.3,400,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළ බඩු උකස් ගන්නන්ගේ ඇප තැන්පතු ගිණුමෙන් ඉවත්කර තිබුණු රු.40,385,000 ක ට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තැන්පතු ආපසු ගෙවීම සඳහා ආදායම් දෙපාර්තමේන්තුව ඉල්ලූවිට මහා භාණ්ඩාගාරය ලබා දෙන බව | අදාළ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතු බව |
| (උ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයෙකු වෙත බදු දී තිබුණු ඉඩමකින් 2010 ජනවාරි 10 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.23,324,800 ක බදු මුදලක් ඉඩම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | රු.1,200,000 ක මුදලක් 2024.02.26 අයකර ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඌ) ඉඩම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ශේෂ පිරික්සුමේ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.15,517,605 ක් වුවද මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ රු.36,338,826 ක් ලෙස දැක්වීම | ශේෂ පිරික්සුමේ ඇතුළත් වන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන ගිණුම් තැබීම් පමණි. එබැවින් විගණන විමසුමේ සඳහන් වෙනස්කම් පවතින බව දක්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් රු.20,821,221 ක වෙනසක් පැවතුණි. | | |
| (එ) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම්, ගොඩනැගිලි හා වාහන වල එකතු වටිනාකම රු.670,664,375 ක් වුවද, එය සිගාස් පරිගණක වැඩසටහනේ රු.637,233,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වත්කම් රු.33,431,375 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිගාස් මෘදුකාංගයට ඇතුළත් කර ඇති වත්කම් ගිණුම්වල ශේෂයන් පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. 2023 වර්ෂයේ අගභාගයේ දී තක්සේරු කරන ලද වත්කම් සිගාස් පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බැවින් ඉදිරියේ දී එම තක්සේරු කරන ලද වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 540 - ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක සීඑස්/සීඑස්/11-8 දරණ ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4 හා 7.3 ඡේදය ආණ්ඩුකාරවරයා භාවිතා කරන ලද නිල වාහන දෙකකට 2020 මැයි සිට 2022 අප්‍රේල් දක්වා මාස 24 ක කාල පරිච්ඡේදය සඳහා ඉන්ධන දීමනා වලට අමතරව රු.930,020 අතිරේක ඉන්ධන වශයෙන් ලීටර් 6720.21 ක් සඳහා ගෙවීම්කර තිබුණි. | පළාත් සභා කිහිපයක් මෙසේ සිදු කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් සිදුකළ බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් මුල්‍ය රීති 54.1.2, 54.1.3 හා 54.1.6 අනුකූලව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් වාහන 06 කට අදාළව සිදුවූ රු.889,506 ක අනතුරු සම්බන්ධයෙන් අලාභහානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.59,125 පළාත් සභා අරමුදලින් කපාහැර ඇති බවත් රු.26,561 ක් රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත් රු.168,031 ක වටිනාකමට අදාළ නඩුව ක්‍රියාත්මකව පවතින බව | අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් වාහන 07 ක රාජ්‍ය ලාංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් වාහන 02 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලය තුළ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) අලාභ හානිය රු.1,458,304 ක් වූ වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් මු.රී.54 ප්‍රකාර ප්‍රාරම්භක පරීක්ෂණ හා අවසන් පරීක්ෂණ සිදු කර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. ඉන් වාහන අනතුරු 01 ක රු.57,081 ක අලාභහානි පළාත් සභා අරමුදලින් කපා හැර තිබුණු අතර තවත් අනතුරු 05 කට අදාළව ප්‍රාරම්භක හා පූර්ණ පරීක්ෂණ සිදු කර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන තිබුණ ද එම අලාභහානි වලින් රු.148,215 ක මුදලක් කපාහැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කර අලාභහානි අයකර ගත යුතුවේ. |

**1.5.2 ශීර්ෂය 541 - සභා ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා ලේකම් නමින් ලියාපදිංචි මෝටර් රථයක් 2018 ඔක්තෝබර් 08 දින සිට වර්ෂ 5කට වැඩි කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි. | මෙම රථය සභා ලේකම් කාර්යාලයේ භාවිතයට අවශ්‍ය නොවන බැවින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට වෙනත් ආයතනයක් වෙත ලබාදීමට එකඟතාවය පලකර ප්‍රධාන ලේකම් වෙත දන්වා යවා ඇත. | වත්කම් සක්‍රීයව උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගෙන් වසර 06 සිට 17 කාලයක් තිස්සේ අයවිය යුතු රු.249,291 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | සභා ලේකම් කාර්යාලයට අයත් වාහන 12 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 12 ක් ප්‍රධාන ලේකම් වෙත භාරදී ඇති බව | වාහන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අලාභ හානිය රු.154,397 ක් වූ වාහන අනතුරු 01 ක් සම්බන්ධයෙන් මූ.රී. 54 ප්‍රකාරව ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාරව අලාභහානි අයකර ගත යුතුවේ. |

### 1.5.3 ශීර්ෂය 543 - ප්‍රධාන ලේකම් කාර්යාලය (පිරිස් හා පුහුණු)

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලයට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලය තුළ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.4 ශීර්ෂය 544 - ප්‍රධාන ලේකම් කාර්යාලය - (පාලන)

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 ඔක්තෝබර් 13 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේ වාහන 05 ක් නිශ්කාර්යව පැවතුණි. | වෙනත් ආයතනයක් වෙත ලබාදීමට එකඟතාවය එල කර ඇති බව. | වත්කම් සක්‍රියව උපයෝජනයට ට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් වාහන 38 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් වාහන 09 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වාහන පිළිබඳ ලේඛන යාවත්කාලීන කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2023 දෙසැම්බර් 31 දිනට පළාත් සභා ආදායම් ගිණුමේ විෂයයන් 04 කට අදාළව රු.135,833,299 ක හිඟ ආදායම් අය කර නොතිබුණි. ඉන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයකර නොගත් හිඟ ආදායම රු.28,513,534 ක් විය. එය මුළු ආදායමින් සියයට 21 ක් වී තිබුණි. | පිළිගනිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් වාහන 04 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | තොරතුරු අනාවරණය කර ගෙන සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |
| (ඊ) | මධ්‍යම පළාත් සභාව සතු ගර්හිත වාහන 38 ක් 2017 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ වෙන්දේසි කර තිබුණ ද එම වාහන වල ලියාපදිංචි අයිතිය අදාළ පෞද්ගලික පාර්ශවය වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදු කරන බව දැනුම් දී ඇත. | ලියාපදිංචි අයිතිය පවරා දීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (උ) | අලාභ හානිය රු.254,151 ක් වූ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් මූ.රී. 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූ.රී. ප්‍රකාර අලාභනාහි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය 546 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත තුළ දේපල හුවමාරුවීමේ දී 2015 ජනවාරි 01 සිට 2022 ජූලි 10 දින දක්වා කාලය තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන බැංකු ජංගම ගිණුමට බැර වී තිබුණු රු.50,613,378 ක මුද්දර බදු ආදායම් සඳහා බැංකුගත කිරීමට අදාළ ලදුපත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ආදායම්වල නිවැරදිතාවය තහවුරු කිරීමට නොහැකි විය. තවද අදාළ ජංගම ගිණුමට බැරව තිබූ රු.1,063,261 ක ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට අසමත් වූ ඉතිරි ලදුපත් ප්‍රමාණය පමණක් විගණන විමසුමට ලක්කර ඇති බව | බැංකු ගත කළ ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමටත්, හඳුනා නොගත් ආදායම නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අඩු වටිනාකම් සහිතව දේපල හුවමාරු කිරීමේ දී හෝ විකිණීමේ දී දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් හඳුනාගෙන දෙපාර්තමේන්තුව වෙත යොමුකළ දේපල පැවරීම් 280 ක් සම්බන්ධව එම දේපලවල වටිනාකම් නිවැරදිව තක්සේරුකර රජයට අයවිය යුතු මුද්දර ගාස්තු රැස් කර ගැනීමට ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | සෑම ඕප්පුවක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. විමර්ශනය නිම නොවූ 05 ක් සඳහා තක්සේරු දැක්වීම් නිකුත් කර රු.416,850 ක මුදලක් අයකර ඇත. | අඩු වටිනාකම් සහිත දේපළ හුවමාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කර නිවැරදි මුද්දර බදු ආදායම රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1990 අංක 17 දරන මධ්‍යම පළාත් මුදල් ප්‍රඥප්තියේ 73(8) වගන්තිය යටතේ සිදුකර තිබුණු දේපල විකිණීම් නැවත තක්සේරු කිරීමේ සිද්ධීන් 96 ක තොරතුරු කැඳවීම් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේ දී අවස්ථා 70 කට අදාළව දේපල හුවමාරු කිරීම්/ විකිණීම් පිළිබඳව අයකළ යුතු අතිරේක මුද්දර බදු රු.5,936,082 ක් අදාළ ගැනුම්කරුවන්ගෙන් මාස 10 ත් වසර 07 ත් අතර කාලයක සිට රැස්කර ගැනීමට ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | අතිරේක ගාස්තු නියම කිරීම දීර්ඝ ක්‍රියාවලියකි. 2023 දී දේපළ තහනම් නියෝග 109 ක් හා අධිකරණයේ නඩු 23 ක් පවරා ඇත. | අතිරේක මුද්දර ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී ගිණුම්ගත කරන බව | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.6 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 අනුව "අගය හුවමාරු ගනුදෙනු වලින් පැන නගින" හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව "අගය හුවමාරු නොවන ගනුදෙනුවලින් පැන නගින" හෝ හඳුනාගත නොහැකි ආදායම් ප්‍රභවයක් වන රු.3,622,114 ක "විලම්භිත ආදායම (Differed Income)", ආදායමක් | 2023 අවසන් ගිණුම් විගණනයට අදාළව පෙන්වා දී ඇති පරිදි ලාභාලාභ ගිණුම ඉදිරි වර්ෂ සඳහා පිළියෙළ කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | 2023 අප්‍රේල් 10 වන දින නිදහස් කර ගන්නා ලද රු.3,000,000 ක ස්ථාවර තැන්පතුව 2023 අප්‍රේල් 11 දින ජංගම ගිණුමට බැංකු ගාස්තු අඩු කිරීමෙන් අනතුරුව රු.2,999,897 ක් ලෙස බැර වී තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා ඒමක් ලෙස සටහන් කළ යුතු වුවද එය මුදල් ගලා යාමක් ලෙස සටහන් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගත් බව විගණනයට සඳහන් කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.2,628,231 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම ද රු.2,628,231 කින් තුලනය වී නොතිබුණි. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අවිනිශ්චිත ගිණුම ශේෂය පිළිබඳ සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට සහ වාර්තා කිරීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුම් ශේෂය කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඈ) | ආයතනය විසින් 2022 අගෝස්තු 08 සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා මුදල් ලැබීම් සටහන් කර මුදල් පොත යාවත්කාලීන කර නොතිබුණි. පරිගණකය ආශ්‍රයෙන් සකස් කරන ලද මුදල් පොතේ 2023 දෙසැම්බර් 31 දිනට රු.3,019,614 ක බැර ශේෂයක් පැවතියද ඒ සම්බන්ධව සොයාබලා මුදල් පොත නිවැරදි කර නොතිබුණි. | ආයතනය විසින් පරිගණකය (Excel) ආශ්‍රයෙන් සකස් කරන ලද මුදල් පොත භෞතික මුදල් පොතෙහි ආකෘතියට අනුව සකස් කර ඇති බව හා මුදල් පොතේ පවතින රු.3,019,614 ක බැර ශේෂය පිළිබඳ වර්තමානය වන විටත් සොයාබලමින් පවතින බව | මුදල් පොතේ පවතින බැර ශේෂය පිළිබඳ පරීක්ෂා කිරීම් සිදුකර නිවැරදි ශේෂය දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය රීති 261.2.2 ප්‍රකාරව කිසියම් කාර්යයක් ඉටුකිරීම සඳහා ලබාදෙන අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවද අවස්ථා 15 කදී ලබාදී තිබුණු 442,600 අතුරු අග්‍රිම අදාළ කාර්ය අවසන්වී දින 30 සිට මාස 08 ක කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. | පියවීමේ දී කාල ප්‍රමාදයක් සිදුවී ඇත. | මූ.රී. ප්‍රකාර ප්‍රමාදයකින් තොරව අග්‍රිම පියවිය යුතුය. |
| (ඊ) | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය සහ 2019 මාර්තු 09 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ | කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගෙවා ඇත. | චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිර්දේශ ලබා ගැනීමකින් තොරව විධායක හෝ මාණ්ඩලික නොවන නිලධාරීන් 11 දෙනෙකු සඳහා 110,500 සමාලෝචිත වර්ෂය තුළ දුරකථන දීමනා ගෙවා තිබුණි. | | |
| (ඩ) | ආරක්ෂක සේවා සහ පවිත්‍රතා සේවා ලබාදීමෙන් 2019 සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා කාලය තුළ පුස්තකාල සේවා මණ්ඩලයෙන් අයවිය යුතු සේවා ගාස්තු එකතුව රු.1,841,626 ක් අයකර ගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත. | හිඟ ගොඩනැගිලි කුලී කඩිනමින් අයකරවා ගත යුතුය. |
| (ඪ) | 2020 නොවැම්බර් 11 දිනැති අංක GCP/AO/8-4 දරන ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය පරිදි ආණ්ඩුකාර අනුමැතියෙන් සංශෝධනය කරන ලද මූල්‍ය රීති 422 අනුව ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනයන්ට අනුව රුපියල් මිලියන 03 ට අඩු භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී ආයතන 05 කට නොඅඩු සංඛ්‍යාවකින් මිල ගණන් කැඳවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සිංහල, හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් ආරක්ෂක සේවයේ සහ පවිත්‍රතා සේවයේ නියුතු කාර්යය මණ්ඩලය වෙත වියළි ආහාර ද්‍රව්‍ය මලු ලබාදීම සඳහා ආයතන 02 කින් මිල ගණන් කැඳවා රු.1,339,380 ක වියලි ආහාර ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. | රජයේ අනුබද්ධ ආයතන 02 ක් වන සතොස සහ සී/ස මධ්‍යම පළාත් විවිධ සේවා සමූපකාර සමිති සංගමය වෙතින් මිල කැඳවූ බව | මූල්‍ය රීති හා අදාළ ලිපියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ණ) | 2020 අගෝස්තු 26 දිනැති අංක DMA/GL/PC/2020 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 01 හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) හා (2) වගන්ති වල දක්වා ඇති නියමයන්ට අනුකූලව ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වා නොතිබුණි. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගී වන බවම | ජාතික විගණන පනත හා පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ත්) | මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයට අයත් වාහන 04 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය - 550 - ප්‍රධාන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.8,000,000 ක මෝටර් රථයක ලියාපදිංචි අයිතිය පෞද්ගලික පාර්ශවයකගේ නමට පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ බව | ලියාපදිංචි අයිතිය වෙනස්වීමට අදාළ හේතු සොයාබලා ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහන 11 ක රාජ්‍ය ලාංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලේඛන යාවත්කාලීන කළ යුතු අතර වාහනය තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) ප්‍රධාන අමාත්‍යාංශය අයත් ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහන 01 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය ප්‍රධාන ලේකම් වෙත පවතින බැවින් අයිතිය පැවරීම සඳහා ප්‍රධාන ලේකම් වෙත දන්වා යවා ඇත. | අපහරණ කටයුතු කාලීනව ඉටුකළ යුතුය. |
| (ඉ) අලාභ හානිය රු.128,073 ක් වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් මු.රී. 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. තවද වාහන අනතුරු 03 ක රු.23,821 ක අලාභහානි පළාත් සභා අරමුදලින් කපාහැර තිබුණු අතර තවත් අනතුරු 02 කට අදාළව ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභහානි වලින් රු.76,090 ක මුදලක් කපාහැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාර අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.7.1 පළාත් පුස්තකාල සේවා මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුස්තකාල සේවා මණ්ඩලය පිහිටි ගොඩනැගිල්ලේ බිම්මහලේ හා පළමු මහලේ වර්ග අඩි 1,200 ක බිම් ප්‍රමාණයක් ලිඛිත ගිවිසුමකින් තොරව 2018 අගෝස්තු 03 දින සිට මාසික කුලී පදනමකට කලාපීය ආර්ථික සංවර්ධන ඒකකයේ පරිගණක විද්‍යාගාරයක් පවත්වාගෙන යෑම සඳහා ලබාදී තිබුණද 2018 අගෝස්තු 03 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා එකතුව රු.4,925,234 ක කුලී අයකර ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පුස්තකාල සේවා මණ්ඩලයට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලේඛන යාවත්කාලීන කර වාහනයේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**1.5.7.2 මුල් ළමාවිය සංවර්ධන ඒකකය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 අංක 03 දරන මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තියේ II වන කොටසේ 16 වගන්තිය අනුව කළමනාකරණ කමිටුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබාදීම සඳහා දහනව දෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත්කල යුතු වුවද ප්‍රඥප්තිය අනුමත වූ දින සිට පසුගිය වර්ෂ 08 ක කාලය තුළ උපදේශක කමිටු පත්කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රඥප්තියේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2018 සිට 2023 දක්වා කාලය තුළ මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘති සඳහා රාජ්‍ය නොවන සංවිධාන 03 කින් ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.3,033,556 ක් අදාළ අරමුණුගත කාර්යන්ට යොදවා ගැනීමකින් තොරව ආදායමට බැර කර තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ලද ප්‍රතිපාදන අදාළ අරමුණු ඉටු කර ගැනීම වැය කළ යුතුය. |

## 1.5.8 ශීර්ෂය 551 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් පාලන ආයතන 09 ක අක්‍රමිකතා 11 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන පැවැත්වීමට අදාළ කමිටු පත්කර මාස 02 සිට අවුරුදු 03 ½ ක් දක්වා කාලයක් ගතවී ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මූලික විමර්ශන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මාස 03 ඉක්මවූ වාර්තා කඩිනමින් ලබාදෙන ලෙස අදාළ කමිටු සාමාජිකයන් ලිපි මඟින් දැනුවත් කර ඇත. වර්තමාන ප්‍රගතියට අනුව වාර්තා 07 ක් ඉදිරිපත් කර ඇත. | මූලික විමර්ශන කටයුතු කඩිනමින් සිදු කිරීමෙන් අවසන් කරන මූලික විමර්ශන වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 2013 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන 06 කට අදාළව නිකුත් කර තිබුණු විගණන අධිභාර 15 ක් එකතුව රු.9,704,687 ක් අයකිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අයකිරීම් ප්‍රගතිය අනුව තවදුරටත් අයකිරීමට ඇති මුදල රු.9,704,687.32 කි. | අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පළාත් මුල්‍ය රීති 54.1.2, 54.1.3 හා 54.1.6 පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 03 කට අදාළව සිදුවූ රු.909,027 ක අනතුරු සම්බන්ධයෙන් අලාභහානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණයෙන් ප්‍රතිපූරණය වී ඇති බවත් රක්ෂණයෙන් ප්‍රතිපූරණය නොවූ කොටස අදාළ වගකිව යුතු පාර්ශව වලින් අයකරගත් බව | රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය වීම් සහ අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම් පිළිබඳව සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) පළාත් මුල්‍ය රීති 54.5 හා 54.6 ට අනුකූල නොවන පරිදි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාහනයකට අදාළව අනතුරකින් සිදුවී තිබුණ රු.10,932 ක අලාභ හානිය සම්බන්ධයෙන් 2023 ජූනි 30 | මු.රෙ. 104(4) පරීක්ෂණය පවත්වා වාර්තාව ලබාදී ඇති බව | මූල්‍ය රීති ප්‍රකාර පවත්වන ලද පරීක්ෂණවල වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| දින වන විටත් කිසිදු මූලික පරීක්ෂණයක් හෝ අවසන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 14 ක රාජ්‍ය ලාංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව පරිදි කටයුතු කළ යුතුය. |
| (ඊ) පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 11 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ලේඛන යාවත්කාලීන කර වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.9 ශීර්ෂය 552 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුල්‍ය රීති 179.1 අනුව චෙක්පතක් මුදල්කර අදාළ ආදායකයා වෙත සෘජුවම ගෙවීමේ හැකියාවක් තිබියදී ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දිවා මුරකරු, රාත්‍රී මුරකරු හා සනීපාරක්ෂක කම්කරු යන තනතුරු දරන පුද්ගලයන්ට අදාළ මුළු වේතනය 1,843,850 අවස්ථා 23 කදී පාසලේ දිවා මුරකරුගේ නමින් පාසල් සංවර්ධන ගිණුමෙන් චෙක්පත් ලියා ගෙවීම් කර තිබුණි. | 104(4) පරීක්ෂණය සිදුකරමින් පවතී. ඉදිරියේ දී විගණනයට වාර්තා කරන බව. | මුල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7 වන වගන්තිය අනුව හඟුරන්කෙත, කටුගස්තොට, මහනුවර සහ ගම්පොල යන කලාප අධ්‍යාපන කාර්යාලවලට අනුයුක්තව සේවය කරන නිලධාරීන් 09 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව විදේශගතවී තිබුණද එම නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දෙදෙනෙකුගේ නිවාඩු අනුමැතිය සඳහා ලබාදුන් ලියකියවිලි වල අඩුපාඩු ඇති බවත්, එක් අයකු විදේශ නිවාඩු අනුමත කර ඇති බවත්, තවත් එක් අයෙකු ධූරය හැර ගියසේ සලකා කටයුතු කරන බවත් ඉතිරි අයගේ විදේශ නිවාඩු මේ වන විට අනුමත කර ඇති බවත් දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1.4 වගන්තිය අනුව අනුමැතිය ලබාගැනීමකින් තොරව මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 12 දෙනෙකු 2019 වර්ෂයේ සිට 2023 ජනවාරි දක්වා කාලය තුළ සී/ස මධ්‍යම පළාත් අධ්‍යාපන සේවා සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට තම රාජකාරි කාලය තුළ සහභාගිවී එකතුව රු.3,674,354 ක දීමනා ලබාගෙන තිබුණි. | සිදුකරනු ලබන පරීක්ෂණ අවසන් වූ වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඈ) මධ්‍යම පළාතේ කලාප 10 ක සේවය කරන ගුරුභවතුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 235 දෙනෙකුගේ සේවය මාස 11 ත් අවුරුදු 32 ත් අතර කාල පරිච්ඡේදයක සිට ස්ථිර කර නොතිබුණි. | 67 කුගේ සේවය ස්ථිර කර ඇත. 25 කුගේ ස්ථිර කිරීම සඳහා අනුමැතියට යවා ඇත. ඉතිරි අයගේ අඩුපාඩු සකස් කර ඉදිරියේ දී ස්ථිර කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව | සේවක මණ්ඩල කළමනාකරණ කටයුතු කාලීනව සහ විධිමත්ව සිදු කළ යුතුය. |
| (ඉ) නුවරඑළිය සහ මහනුවර කලාපවල සේවය කරන ගුරුභවතුන් 05 දෙනෙකු හා ශිල්පීය නොවන සේවයේ තිදෙනෙකු තනතුරට අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබියදී සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් සේවයේ යොදවා තිබුණි. | මහනුවර කලාපයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලා ඇත.<br>නුවරඑළිය කලාපයේ ගුරු සහයක නිලධාරියෙකුගේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත් එක් ගුරුවරියකගේ සේවය අවසන් කිරීමට නිර්දේශ කර ඇත. | තනතුරට අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ නොකළ දැනට සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් විධිමත් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) මප/මහ/විද්‍යාලෝක මහා විද්‍යාලයේ 2021 මාර්තු 18 දින සිට සේවය කරන ගණිත ගුරුවරයකු වෙත ඉගැන්වීම් සඳහා කාලසටහනක් ලබානොදී පාසැලේ අධ්‍යාපන කටයුතු වල නිරත නොවී වෙනත් බාහිර කටයුතුවල යොදවා ගෙන රාජකාරි ඉටුකිරීමකින් තොරව 2021 මාර්තු සිට 2023 ජනවාරි දක්වා කාලය තුළ වැටුප් ලෙස රු.2,146,072 ක් ගෙවා තිබුණි. | 104(3) පරීක්ෂණයක් සිදුකරමින් පවතී. | තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමකින් තොරව ගෙවූ වැටුප් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) ගම්පොල සහ හැටන් කලාපවලට අයත් පාසල්වල සේවය කල ගුරුභවතුන් සහ අනෙකුත් සේවකයන් 27 දෙනෙකු විදේශ නිවාඩු ලබා විදේශගතව හා ධූරය හැරගොස් තිබුණද ඒ බව විදුහල්පතිවරුන් විසින් විදිමත් ලෙස කලාප අධ්‍යක්ෂ වෙත දන්වා නොතිබීම හේතුවෙන් රු.854,912 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | වැඩිපුර ගෙවූ වැටුප් ඊට අදාළ වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඍ) හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදුවී තිබුණු වැටුප් සම්බන්ධව මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව ප්‍රධාන ලේකම් විසින් පත්කර තිබූ විමර්ශන මණ්ඩලයේ වාර්තාව අනුව ගුරු සේවයේ දෙදෙනෙකු හා පාසල් කම්කරුවෙකු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට හා අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් 07 දෙනෙකුට ආයතන සංග්‍රහයේ II වැනි බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25 වගන්තිය අනුව ලඝු විනය කාර්ය පටිපාටිය යටතේ නිසි ක්‍රියාමාර්ග ගතයුතු බව දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිටත් අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ගුරු සේවයේ නිලධාරින් දෙදෙනා හා පාසල් කම්කරුවෙත විධිමත් පරිදි චෝදනා පත්‍ර භාරදී විනය පරීක්ෂණ සඳහා විනිශ්චය සභා පත්කර ඇති අතර ලිපි ලේඛන වල පවතින අඩුපාඩු හේතුවෙන් පරීක්ෂණ කටයුතු ප්‍රමාද වී ඇත.<br>අධීක්ෂණ මට්ටමේ නිලධාරින් 07 දෙනා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25 වගන්තිය අනුව, එක් අයෙකුට 2023 නොවැම්බර් 07 දිනැති ලිපිය මඟින් තරයේ අවවාද කර තිදෙනෙකුට 2023 ඔක්තෝබර් 16 දිනැති ලිපි මඟින් ලඝු විනය යටතේ දඬුවම් ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (එ) ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක දී පෞද්ගලික ආයතනයකින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් ලෙස දක්වා ව්‍යාජ බිල්පත් සකස් කර පාසල් සංවර්ධන අරමුදලින් එකතුව රු.710,533 ක චෙක්පත් 07 ක් විද්‍යාලයේ එවකට විදුහල්පතිවරයාගේ හා ඔහුගේ භාර්යාවගේ බැංකු ගිණුම් වලට බැර කරගෙන අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් 104(4) පරීක්ෂණයක් පැවැත්වේ. ඒ අනුව කටයුතු කර විගණනයට වාර්තා කරන බව. | මූල්‍ය අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණ සිදු කිරීමෙන් අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඒ) මහ/ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේ හිටපු විදුහල්පතිනිය පාසලට අයත් වෑන් රථය භාවිතා කර 2018 ජනවාරි 15 දින සිට 2023 ජූනි 16 දින දක්වා පාසලට ඒමට සහ යාමට දිනකට ගමන් වාර 04 බැගින් එක් දිනකට කි.මී.112 බැගින් ගමන් කිරීම සඳහා පාසල් සංවර්ධන සමිතිය මඟින් අනුමැතියකින් තොරව එකතුව රු.1,283,037 කට ආසන්න මුදලක් ඉන්ධන සඳහා වැය කර තිබුණි. | මූ.රෙ. 104(3) පරීක්ෂණයක් පැවැත්වේ. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | මූල්‍ය රීති ප්‍රකාරව සහ ආයතන සංග්‍රහයේ පවතින විධිවිධාන ප්‍රකාරව අක්‍රමිකතා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ඔ) මප/හැ/නිශ්ශංකමල්ල ප්‍රාථමික විදුහල 2016 වර්ෂයේ නිශ්ශංකමල්ල ද්විතියික පාසලෙන් වෙන්කර වෙනත් ස්ථානයක 60'x20' ප්‍රමාණයේ ගොඩනැගිල්ලක පන්ති ආරම්භ කර පසුව එම ගොඩනැගිල්ලේ වහලය කඩා ඉවත් කර 80'x25' දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.15,700,655 ක ඇස්තමේන්තුවකට 2021 අගෝස්තු 16 දින කොන්ත්‍රාත්කාර | පිළිතුරු සපයා නැත. | සිදුවූ අක්‍රමිකතාව සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ (ගොඩනැගිලි) විසින් ඉදිකිරීම් පවරා 2021 දෙසැම්බර් 28 දින වනවිට කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ගිවිසුම්ගතව තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් මුල් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු පැතිබැම්ම ඉදිකිරීම සහ ඇස්තමේන්තුවේ ඇතුළත් අයිතමවලින් කොන්ක්‍රීට් කණු 19 ක් පමණක් ඉදිකර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කර නැවත ප්‍රසම්පාදනය කිරීමට කටයුතු නොකර මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 ඔක්තෝබර් 31 දින පැවැත් වූ ප්‍රසම්පාදන මණ්ඩල කමිටු තීරණය අනුව කොන්ත්‍රාත්කරු සහ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා අධ්‍යාපන ගොඩනැගිලි) අතර අන්‍යෝන්‍ය එකඟතාවයක් මත ගිවිසුම අවසන් කර තිබුණි. ඒ වනවිට කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.3,963,395 ක් නිශ්ඵල වියදමක් බවට පත්ව තිබුණි. මෙම පාසලේ ළමුන් 117 දෙනෙකු ඉගෙනගන්නා අතර අවම පහසුකම් පවතින පේෂකර්මාන්ත ගොඩනැගිල්ලක දැනට ඉගැන්වීම් සිදුකරන බව දක්නට ලැබුණි. තවද, මෙම මුල් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමේදී එහි තිබුණු වටිනා දැව සහ අනෙකුත් ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් පාසලට භාරදී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ නවතා ඇති ගොඩනැගිල්ල අවට වල් බිහිවී විනාශවීමට ඉඩහැර තිබුණි. | | |
| (ඔ) | නු/ශ්‍රීමත් ජේම්ස් පීරිස් විදුහලේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ ඉකුත් වර්ෂයේ රු.1,460,000 ක ප්‍රතිපාදන ලබාදී ඉන් රු.733,525 ක් වැය කර අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණ නොකර ඉදිකිරීම් කටයුතු අත්හැරදමා තිබුණි. | පිළිතුරු සපයා නැත. | අදාළ ව්‍යාපෘතියට අදාළ සැලසුම් කළ කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ක) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් ගොඩනැගිලි 189 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.771,065,663 ක් වැයකර තිබුණ ද ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් අදාළ ගොඩනැගිලි භාවිතයට ගැනීමට නොහැකිව පැවතුණි. | සම්පූර්ණ ගොඩනැගිල්ල නොව අදියර වශයෙන් හෝ ඉටු කිරීම සඳහා වාර්ෂික ප්‍රතිපාදන වෙන්වේ. | ඉදිකිරීම් සම්පූර්ණ කර ගොඩනැගිලි භාවිතයට ගත යුතුය. |
| (ග) 2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ අ.පො.ස(සා.පෙළ) විභාගයට පෙනී සිටි මධ්‍යම පළාතේ සිසුන්ගේ ප්‍රතිඵල අනුව දීපව්‍යාප්ත පළාත් කුසලතා මට්ටම 5 ත් 8ත් අතර ස්ථානයකට පත්ව තිබුණි. තවද එම ප්‍රතිඵලවලට අනුව මධ්‍යම පළාතේ කලාප 15 න් කලාප 10 ක ප්‍රතිඵල දීපව්‍යාප්ත කලාප මට්ටම අනුව 50 වැනි ස්ථානයෙන් ඉහල අගයන් ගෙන තිබුණි. | මධ්‍යම පළාත ලබාගෙන ඇති සියයට 72.73 ක ප්‍රතිඵල මට්ටම පහළ අගයක් නොවන බව දන්වමි. 50 වන ස්ථානය පිළිගනිමි. අසමත්වීමේ මට්ටමේ සිටින සිසුන් සමත් කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සමඟ ගිවිසුම් ගත විය. | සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ නැන්වීමට කටයුතු කළ යුතුය. |
| (ච) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද පහ වසර ශිෂ්‍යත්ව විභාගයට මධ්‍යම පළාතේ පෙනී සිටි සිසුන්ගෙන් ලකුණු 70 ඉක්මවා ලබාගැනීමේ ප්‍රතිශතය අනුව මධ්‍යම පළාත දීපව්‍යාප්ත කුසලතා මට්ටමේ හත්වන හා අටවන ස්ථානවලට පත්ව තිබුණි. එසේම එම ප්‍රතිඵලවලට අනුව මධ්‍යම පළාතේ කලාප 15 න් කලාප 11 කම ප්‍රතිඵල දීපව්‍යාප්ත කලාප මට්ටම අනුව 50 වන ස්ථානය ඉක්මවා තිබුණි. | ලකුණු 70 ට අඩුවීමේ ප්‍රතිශතය වාර්ෂික සියයට 19 ක් 25 ත් අතර වේ. මෙම ප්‍රතිශතය අඩුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. ජාතික මට්ටම හා සසඳන කළ 2.2.1 ක සුළු ප්‍රමාණයක් වන අතර එය කැපී පෙනෙන අඩුවීමක් ලෙස සැලකිය නොහැක. | දීප ව්‍යාප්ත කුසලතා මට්ටම සහ කලාප මට්ටම ඉහළ නැන්වීමට කටයුතු කළ යුතුය. |
| (ජ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වාහන 24 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව පරිදි කටයුතු කළ යුතුය. |
| (ට) අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වාහන හා යතුරුපැදි 05 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂය 553 - පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ඉඩම් බදු ආදායම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 36 කින් එකතුව රු.68,561,923 ක ඉඩම් බදු බදුකරුවන්ගෙන් අයකර නොතිබුණි. එයින් එකතුව රු.62,627,387 ක හිඟ බදු ආදායමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 කට අදාළ වන අතර එම අගය අයවිය යුතු මුළු හිඟ බදු ආදායමෙන් සියයට 91 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් ක්‍රියාවලිය දුර්වලව මට්ටමක පැවතුණි. | ඉඩම් බදු හිඟ ආදායම් අයකර ගැනීම ප්‍රාදේශීය ලේකම් සිදුකරනු ලබන බවත් ඒ පිළිබඳ පසුවිපරම් කිරීමේ ක්‍රියාවලියක් සිදුකරන බව | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම පළාතේ ඉඩම් ලාභීන්ගෙන් ආරවුල් සහිත ඉඩම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් දෙපාර්තමේන්තුවට මැනුම් ඉල්ලීම් 903 ක් ලැබී තිබුණු අතර ඉන් මහනුවර දිස්ත්‍රික්කය තුළ ලැබී තිබුණු ඉල්ලීම් 670 ක් අතරින් සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලීම් 55 ක් පමණක් නිම කර තිබුණි. | සර්වේ ජනරාල්ගේ ශේෂ නිලධාරි චක්‍රලේක 6/2007 අනුව සාමාන්‍යයෙන් මිනින්දෝරුවෙකුට මසකට නිමකළ හැකි මැනුම් ඉල්ලීම් 04 කි. | මැනුම් ඉල්ලීම් ඉටු කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක තෝරාගත් පාසල් 50 ක පාසල් ඉඩම් අත්පත්කර ගැනිමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.64,263,189 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන වෙන්කර වර්ෂ 01 සිට 13 දක්වා කාලයක් ගතවී තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | පාසල් ඉඩම් 08 ක් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් පාසල් ඉඩම් 50 ක අත්පත් යෝජනා වේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු විධිමත්ව සිදුකරවා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක පිහිටි ජල විදුලි බලාගාර 03 ක් වර්ෂ 03 සිට වර්ෂ 20 දක්වා කාලසීමාවක සිට විදුලිය නිෂ්පාදනය කර ජාතික පද්ධතියට විදුලිය මුදාහැර ඇතත් එම බලාගාර සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ජල හැරවුම් අවසර පත් නිකුත් කර බදු අයකිරීමට කටයුතු නොකිරීමෙන් රු.4,668,164 ක බදු ආදායමක් පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. | බදු අයකර නොමැත. | බදු අවසරපත් විධිමත්ව නිකුත් කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) ඉඩම් දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහන පිළිබඳ තොරතුරු නිසිපරිදි පවත්වා ගෙන යාමටත් අදාළ තොරතුරු රැස්කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 554 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරාගත් පසුව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ලේඛන යාවත්කාලීන කර වාහනය තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.12 ශීර්ෂය 555- පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමත කල රු.31,650,000 ක කර්මාන්ත 02 ක් ද, වෙනත් අරමුදල් යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල රු.239,619,000 ක ව්‍යාපෘති 25 ක්ද HSEP ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කල රු.421,321,000 ක ව්‍යාපෘති 33 ද සමාලෝචිත වර්ෂය තුළදී ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.13 ශීර්ෂය 556 - පළාත් සංචාරක කටයුතු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මාතලේ සංචාරක ප්‍රවර්ධන සංකීර්ණය පරිපාලනය කරන පාලක මණ්ඩලයේ රැස්වීම් තීරණ අංක 07 ප්‍රකාරව මසකට රු.1,000 ක් අයකරමින් මාතලේ හෝටල් පාසැලේ මුළුතැන්ගෙය හා පංති කාමර 02 ක් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වෙත ලබා දීමට 2012 මාර්තු 16 දින තීරණය කර තිබුණි. මේ සම්බන්ධව 2023 දෙසැම්බර් 06 දින සිදු කළ භෞතික පරීක්ෂණය අනුව අනුමැතියකින් හා කුලී ගෙවීමකින් තොරව වර්ග අඩි 4000 ක් සහිත මුළු හෝටල් පාසැලම කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පරිහරණය කරන බව නිරීක්ෂණය විය. එසේම නීත්‍යානුකූල තක්සේරුවක් මත ලිඛිත ගිවිසුමකින් තොරව මාතලේ හෝටල් | පිළිගනිමි. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් ඉල්ලා ඇත. | පාලක මණ්ඩලයේ රැස්වීම් තීරන අනුව කටයුතු කිරීමටත් අහිමි වූ ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පාසල කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වසර 10 ක් ඉක්මවා පරිහරණය කිරීම හේතුවෙන් පළාත් සංචාරක කටයුතු දෙපාර්තමේන්තුවට උපයා ගැනීමට තිබූ රු.මිලියන 25 ක් පමණ ආදායමක් අහිමි වී තිබුණි. | | |
| (ආ) සංචාරක කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ රු.7,948,336 ක වියදමක් දරා රංගිරි දඹුලු රජමහා විහාරයට අයත් ඉඩමක, දඹුල්ල ආයුර්වේද සුවතා මධ්‍යස්ථානය ඉදිකර තිබූ අතර 2023 වසර අවසාන වන විට වසර 07 ක කාලයක් ගතවී තිබුණද, ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා ස්ථාපිත කළ අරමුණු ඉටුකර ගත නොහැකිව ආරම්භ කළ දින සිට 2023 වර්ෂ අවසානය තෙක් මෙම ආයුර්වේද සුවතා මධ්‍යස්ථානය භාවිතයකින් තොරව පැවතුණි. | දඹුල්ල ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවා නිලධාරි නිර්දේශය ආයුර්වේද සුවතා මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීමටය. මධ්‍යස්ථානය ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරන ලෙස සෞඛ්‍ය ලේකම්ද දඹුල්ල මහනගර සභාවට පැවරීමටද ඉල්ලීම් කර ඇත. | ඉඩමේ අයිතිය පවරා ගැනීමටත් ආයුර්වේද මධ්‍යස්ථානය භාවිතයට ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සංචාරක කටයුතු දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක රාජ්‍ය ලාංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට හා ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබූ අතර එම වාහනයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව හා කැබ් රථය පවරා ගැනීමෙන් පසුව තක්සේරු වටිනාකම ගිණුම්ගත කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කර වාහන ලේඛන යාවත්කාලීන කර තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය - 557 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වාහන 06 ක රාජ්‍ය ලාංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡන යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අලාභ හානිය රු.40,028 ක් වූ වාහන අනතුරු 01 ක් සම්බන්ධයෙන් මූල්‍ය රීති 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. තවද වාහන අනතුරු 01 ක රු.12,723 ක අලාභහානි පළාත් සභා අරමුදලින් කපාහැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත.. | මූල්‍ය රීති ප්‍රකාරව අදාළ පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභහානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 558 - සමූපකාර සේවක කොමිෂන් සභාව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමූපකාර සේවක කොමිෂන් සභාවට අයත් වාහන 03 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 560 - සෞඛ්‍ය අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 02 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි ආයතනයේ නම සටහන් කිරීමට හා වාහන ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබූ අතර එම වාහන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව හා ප්‍රධාන ලේකම් වෙත ලියාපදිංචි අයිතිය පවතින බවත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත අයිතිය පැවරීමට මෙතෙක් තීරණය කර නොමැති බවත් | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කර වාහන ලේඛන යාවත්කාලීන කර තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වාහන 05 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහනවල තොරතුරු නිසි පරිදි පවත්වාගෙන යාමටත්, අදාළ තොරතුරු රැස්කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි.

**1.5.17 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05 කට වැඩි කාලයක සිට දිගින් දිගටම පැවත එන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රු.171,988,242 ක අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | මෙම ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා කොළඹ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලිඛිතව තොරතුරු ඉල්ලා ඇත. | අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රෝහල් 03 ක සමාලෝචිත වර්ෂය අවසාන දිනට මාස 03 සිට මාස 96 දක්වා කාල පරාසයක් තුළ එකතුව රු.3,250,741 ක කල් ඉකුත් වූ ඖෂධ ඒකක 452650 ක් හා ගලගෙදර ප්‍රාදේශීය රෝහලේ රු.398,280 ක තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 72206 ක් පැවතුණි. | කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් ඒකකය මැදිහත් වී අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | ඖෂධ කල් ඉකුත් වීම සහ තත්ත්වයෙන් අසමත්වීම් වලින් බැහැරවීම සඳහා ඖෂධ විධිමත්ව බෙදාහැරීම් සහ තොග ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමේ ක්‍රියාවලියකට ලක් කිරීම. |
| (ඇ) | මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණවල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදල 2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අය කර ගැනීමට නිර්දේශ කර තිබුණද ඉන් නිලධාරීන් 08 දෙනෙකුගෙන් එකතුව රු.1,618,191 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අයකරගෙන නොතිබුණි. | නිලධරයන් 08 කුගේ තවදුරටත් අධිභාර කළ යුතු මුදල රු.1,594,455 කි. | අධිභාර කළ යුතු මුදල් අයකර ගැනීමටත් අදාළ නිලධාරීන් සම්බන්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් කටුයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෙල්දෙණිය මුලික රෝහලේ සේවය කළ වෛද්‍ය නිලධාරිවරයෙකු 2016 මැයි 02 සිට 2021 මැයි 01 දින දක්වා කාලය තුළ වැටුප් රහිත නිවාඩු අනුමත කරගෙන විදේශගතවී තිබුණු නමුත් 2023 ඔක්තෝබර් වන විටද සේවයට වාර්තා කර නොතිබුණු බැවින් ගිවිසුම් ප්‍රකාරව අය කරගත යුතු රු.1,175,222 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම රෝහලේ වෛද්‍ය නිලධාරිනියක් විධිමත් පරිදි විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව 2022 ජූනි 28 දින සිට 2022 ඔක්තෝබර් 06 දක්වා විදේශගත වී සිටිය ද එම කාලය සඳහා රු.350,325 ක වැටුප් ගෙවා තිබුණි. | ආපසු ගෙවීමට නිලධාරින් දැනුවත් කර ඇත. ගෙවීම් පැහැරහරින්නේ නම් නීත්‍යානුකූලව කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමටත් විදේශ නිවාඩු අනුමත නොවූ කාලය තුළ ගෙවූ වැටුප් අයකිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින රිකිල්ලගස්කඩ හා හතරලියද්ද රෝහල් දෙකෙහි සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එකතුව රු.2,879,966 ක ඖෂධ ඒකක 25074 ක ඌනතාවයක් පැවතුණි. | වාර්තාවන ඌණතා සම්බන්ධයෙන් ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කරන බව | ඌණතාවය සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ඊ) | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය භාවිතා කරනු ලබන වටිනාකම හඳුනාගත නොහැකි ගිලන් රථයක් ලියාපදිංචි අයිතිය පෞද්ගලික වැවිලි සමාගමක් නමින් පැවතුණි. | අපහරණය සඳහා වෙන්කර ඇත. මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර, පෞද්ගලික ආයතනය විසින් නැවත ඔවුන්ගේ ආයතනය වෙත ගෙන යන බවට ලිපියක් එවා ඇත. | ලියාපදිංචි අයිතිය වෙනස්වීමට අදාළ තොරතුරු අනාවරණය කර ගත යුතුය. |
| (උ) | පළාත් මූල්‍ය රීති 54.5 හා 54.6 ට අනුකූල නොවන පරිදි මාතලේ සහ නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල වාහන 05 කට අදාළව අනතුරුවලින් සිදුවී තිබුණ රු.1,411,172 ක අලාභ හානි සම්බන්ධයෙන් 2023 ජූනි 30 දින වන විටත් කිසිදු මූලික පරීක්ෂණයක් හෝ අවසන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මාතලේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටු පත්කර ඇතත් මෙතෙක් වාර්තා ඉදිරිපත් වී නොමැති බව නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 02 ක අලාභ පොතෙන් ලියා අස්කර ඇති බවත් එක් වාහනයක මු.රෙ. 104(4) පරීක්ෂණ සිදුකරමින් පවතින බවත් | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඩ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව මහනුවර, මාතලේ සහ නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් වාහන 129 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලය තුළ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඪ) සෞඛ්‍ය දෙපාර්තමේන්තු සහ මහනුවර, මාතලේ සහ නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් වාහන 237 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ● මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මෙම වර්ෂය අවසන් වීමට පෙර ගිණුම්ගත කරන බව<br>● මාතලේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වාහනයක් දඹුල්ල දිස්ත්‍රික් රෝහලට භාර දී ඇති බවත් එමඟින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙසට දන්වා යවා ඇති බවත්<br>● නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සිගාස් වැඩසටහන මඟින් ගිණුම්ගත කිරීමට නියමිත බව | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ණ) නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහනයක් අනතුරට භාජනය වී, අළුත්වැඩියා කිරීමකින් තොරව පැවති අතර එහි අළුත්වැඩියා වියදම රු.16,500,000 ක් බව හඳුනාගෙන තිබුණි. | අදාළ රථය අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව මෝටර් රථ පරීක්ෂක විසින් නිර්දේශ කර ඇති බවත්, මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන බවත්, රක්ෂණ ආයතනයෙන් රු.6,600,000 ක මුදලක් ලබාදීමට ලිඛිත එකඟතාවය පලකර ඇති බව | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ත) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන 04 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහන වල තොරතුරු නිසි පරිදි පවත්වා ගෙනයාමටත්, අදාළ තොරතුරු එක්රැස් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ථ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මහනුවර හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය නුවරඑළියෙහි වසර 01 ත් 10 ත් අතර කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහන 18 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ● සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන 02 ක් වෙන්දේසි වී ඇති බව.<br>● මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 02 ක් අළුත්වැඩියා කර භාවිතා කරන බව, වාහන 03 ක් මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයට හා වාහන 01 ක් මහනුවර මහනගර සභාවට භාරදී ඇති | භාවිතයට ගත නොහැකි වාහන කඩිනමින් අපහරණ ක්‍රියාවලියකට ලක් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බව, වාහන 02 ක් අපහරණය කරන තෙක් රඳවාගෙන ඇති බව<br>• නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 01 ක් ලියාපදිංචි හිමිකරුට විධිමත් පරිදි භාරදී ඇති බව, වාහන 02 ක් වත්තේගම නගර සභාවට හා කොටගළ කේම්බ්‍රිජ් විද්‍යාලයට ලබාදෙන බව, වාහන 01 ක් ලිඳුල සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ ගාල්කර ඇති බව, වාහන 01 ක් නැවත අළුත්වැඩියා කර භාවිතයට නියමිත බව හා වාහන 03 ක් අපහරණය කිරීමට ඉල්ලීම් කර ඇති බව | |
| (ක) | මාතලේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අලාභ හානිය රු.2,717,500 ක් වූ වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් මූල්‍ය රීති 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. තවද වාහන අනතුරු 03 ක රු.2,235,500 ක අලාභහානි ප්‍රතිපූරණය කර ගෙන නොතිබූ අතර තවත් වාහන අනතුරු 01 ක ප්‍රාරම්භක හා පූර්ණ පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභහානි වලින් රු.698,997 ක මුදලක් කපාහැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ග) | නුවරඑළිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අලාභ හානිය රු.16,500,000 ක් වූ වාහන අනතුරු 01 ක් සම්බන්ධයෙන් මූල්‍ය රීති 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. තවද වාහන අනතුරු 02 ක ප්‍රාරම්භක හෝ පූර්ණ පරීක්ෂණ සිදුකර එම අලාභහානි වලින් රු.333,193 ක මුදලක් කපාහැර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 562 - මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2014 හා 2015 වර්ෂවල දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කම්කරුවන් ලෙස සේවය කළ සේවකයින් 26 දෙනෙකු උපස්ථායක තනතුරේ iii ශ්‍රේණියට බඳවාගෙන තිබුණි. එසේ උපස්ථායක තනතුරට පත් කිරීමේදී ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 05.03.01 වගන්තිය ප්‍රකාරව වැටුප් ගැලපීමේ දී උසස්වීම් ලබන අවස්ථාවේදි නිලධාරියා අවසාන වශයෙන් ලද වැටුප, නව වැටුප් පරිමාණයේ වැටුප් පියවරවල් අතර ගැනේ නම් ආසන්න ඉහළ වැටුප් පියවරේ තබා අතිරේඛ වැටුප් වර්ධකයක් පමණක් ගෙවිය යුතු වුවත්, උපස්ථායක තනතුරේ ii ශ්‍රේණියේ ආරම්භක වැටුපේ පිහිටුවීම නිසා වැටුප් වර්ධක 10 ක ප්‍රමාණයක් ඉදිරියෙන් වැටුප පිහිටුවා තිබීම හේතුවෙන්, 2014 සිට 2023 දක්වා වූ වසර 10 ක කාලයක් සඳහා අතිකාල දීමනා හා වෙනත් දීමනා හැර නිලධාරීන් 26 දෙනෙකුට රු.4,259,877 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | නිවරදි වැටුපෙහි පිහිටුවා එවකට සිදුකර ඇති වැටුප් පරිවර්ථන සංශෝධනය කරන ලදි. වැඩිපුර ගෙවීම් වාරික මඟින් අයකිරීමට කටයුතු කරන බව. | වැඩියෙන් ගෙවූ වැටුප් අයකර ගත යුතුය. |
| (ආ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වාහන 01 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහනවල තොරතුරු නිසි පරිදි පවත්වා ගෙන යාමටත්, අදාළ තොරතුරු එක්රැස් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. |

## 1.5.19 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 54.5 හා 54.6 ට ප්‍රකාර මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනයකට අදාළව අනතුරකින් සිදුවී තිබුණ අලාභ හානි සම්බන්ධයෙන් 2023 ජූනි 30 දින වන විටත් කිසිදු මූලික පරීක්ෂණයක් හෝ අවසන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණය පවත්වා ඇති බවත් වාර්තාව කඩිනමින් ලබාදෙන බව | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ආ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහන 05 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට වාහන ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එක් වාහනයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව හා ගිණුම්ගත කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට වසර 02 ත් 05 ත් අතර කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | එක් රථයක් අපහරණය කිරීමටත් තවත් රථයක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට අපහරණ කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇති බව | අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන අළුත්වැඩියා කිරීමටත්, එසේ කළ නොහැකි වාහන අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | අලාභ හානිය රු.762,881 ක් වූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මූල්‍ය රීති 54 ප්‍රකාර ප්‍රාරම්භක හා අවසන් පරීක්ෂණ සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. තවද වාහන අනතුරු 02 ක රු.51,205 ක අලාභහානි පළාත් සභා අරමුදලින් කපාහැර තවත් වාහන අනතුරු 02 ක රු.400,072 ක අලාභහානි ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**1.5.19.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------------- | ------------ |
| (අ) | රාගල බස්නැවතුම්පල පිහිටි ඉඩම සම්බන්ධව 2001 වර්ෂයේ පිළියෙල කල පිඹුරු පතකට අනුව අක්කර 02 යි පර්චස් 24 ක් පවතින බව දක්වා තිබුණද ඊට අදාළව 2017 ජුලි 09 දින පිළියෙල කල සැලසුම හා 2022 සැප්තැම්බර් 15 දිනැති හිමිකම් ඔප්පුව ප්‍රකාරව ඉඩම අක්කර 01 යි රූඩ් 01 යි සහ පර්චස් 35 ක් ලෙස දක්වා රූඩ් 02 යි පර්චස් 29 ක් අනවසර පදිංචිය සඳහා ඉඩහැර අයිතිය අවිධිමත්ව බැහැරකර තිබුණි. | අධිකරණයේ නඩුවක් පවතින බැවින් ඉදිරි කටයුතු සිදුකිරීම ප්‍රමාදවීම. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩමේ අයිතිය විධිමත්ව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මගී ප්‍රවාහන සේවා අධිකාරියේ බඳවාගැනීමේ පරිපාටිය පරිදි ස්ථානභාර නිලධාරි I ශ්‍රේණියට උසස්වීමට ස්ථානභාර නිලධාරි II ශ්‍රේණියේ උපරිම වැටුප් තලයට එළඹීමෙන් පසු එනම් බඳවා ගැනීමෙන් වසර 18 කට පසුව හිමිකම් ලැබෙන බව සඳහන් කර තිබුණද 2002 සැප්තැම්බර් 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව නිලධාරියාගේ පත්වීමෙන් වසර 01 මාස 06 කට පසුව එනම් 2002 සැප්තැම්බර් 06 දින නිලධාරියාගේ ඉල්ලීම් සලකා එම නිලධාරියා ස්ථානභාර නිලධාරි පළමු පන්තියේ පිහිටුවීමට අධිකාරිය කටයුතු කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි ස්ථානභාර නිලධාරි I ශ්‍රේණියේ වැටුප් තලය ලබාදීමට කටයුතු කර ඇත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය 13.1 (ආ) හි විධිවිධාන ප්‍රකාරව අදාළ බලධාරීන්ගේ අනුමැතියකින් තොරව හා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්යය පරිපාටි සංග්‍රහයේ (2015 ) H.M.1.3 4.1.1 හා 4.1.2 හි සඳහන් H.M.1.1 සේවා ගණයේ අභ්‍යන්තර අයදුම්කරුවෙකු සපුරාගත යුතු සුදුසුකම් සපුරාගෙන නොතිබුණු මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ජොෂ්ඨ | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි පුරප්පාඩු කිහිපයක් සම්බන්ධයෙන් වැඩ ආවරණ මත රාජකාරි ඉටු කරනු ලබයි. | පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| කළමණාකරු (ධාවන) තනතුරේ ස්ථිර නිලධාරියෙකු 2021 අගෝස්තු 05 දින සිට නියෝජ්‍ය සමානාඝාධිකාරි (සංවර්ධන) තනතුරේ රජකාරි ආවරණය සඳහා හා 2023 පෙබරවාරි 02 දිනැති ලිපියෙන් සාමාන්‍යාධිකාරි (වැඩබලන) තනතුරට අධිකාරියේ සභාපති විසින් පත් කර තිබුණි. | | |
| (ඇ) පළාත් මූල්‍ය රීති 54.5 හා 54.6 ට පටහැනිව මගී ප්‍රවාහන සේවා අධිකාරියට අයත් වාහන 03 කට අදාළව සිදුවී තිබුණ රු.2,297,968 ක අලාභ හානි සම්බන්ධයෙන් මූල්‍ය රීති 54 ප්‍රකාර 2023 ජූනි 30 දින වන විටත් කිසිදු මූලික පරික්ෂණයක් හෝ අවසන් පරික්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මූ.රෙ.104(4) පරීක්ෂණය පවත්වා අලාභ අයකර ගැනීමට කටයුතු කරන බව | මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ඊ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මගී ප්‍රනාහන සේවා අධිකාරියට අයත් වාහන 27 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.19.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ රු.1,714,250 ක් වැය කර ගම්පොළ බහු කාර්යය ගොඩනැඟිල්ල කල්බදු දීම සඳහා අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම් පල කර තිබුණද ගොඩනැඟිල්ල ව්‍යාපාරික අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි ඉදි නොකිරීම හේතුවෙන් පරිශ්‍රය බදු ගැනීමට ඉල්ලුම් කරුවන් ඉදිරිපත් නොවීමෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වී තිබුණි. | නිෂ්කාර්ය වියදමක් නොව ප්‍රසම්පාදන කටයුතු කිරීමේ කාර්යයක් බව. | වියදම් නිශ්කාර්ය නොවීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු ඒකකය විසින් 2010 අගෝස්තු 17 දින සිට 2023 ජනවාරි 05 දින දක්වා කාලය තුළ ආයතන 34 ක අවස්ථා 86 කදී යන්ත්‍ර අලුත්වැඩියා සිදු කර දීම වෙනුවෙන් අය කල යුතු ගාස්තුව එකතුව රු.5,605,441 ක් අය කර නොතිබුණි. ඉන් රු.4,141,876 ක් වසර 05 කට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි. | 2016 වර්ෂයේ සහ එම වර්ෂයට පෙර ආදායම් අය කර ගැනීමේ ක්‍රම දෝෂයක් සහ ගැටළු පැවතුණි. මේ වන විට හිඟ මුදලින් රු.4,034,941 ක් ලැබී ඇත. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවා මධ්‍යස්ථානයේ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණ පුහුණුව ලත් කාර්යමණ්ඩලය බඳවා ගැනීම ප්‍රමාද වීම මත 2015 වර්ෂයේදී අඹතැන්න සේවා මධ්‍යස්ථානයට මිලදී ගෙන තිබූ රු.4,040,000 වටිනාකමැති යන්ත්‍ර 03 ක් වසර 08 කට වැඩි කාලයක් තිස්සේ සේවා මධ්‍යස්ථානය තුළ නිෂ්කාර්යයව පැවතුණි. | යන්ත්‍ර 02 ක් සක්‍රීය ආදායම් උපදවයි. අනෙක් යන්ත්‍රය සඳහා පුහුණු සේවකයෙකු බඳවා ගැනීමට නොහැකි වී ඇත. | තාක්ෂණ පුහුණුවලත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන සේවා මධ්‍යස්ථානය සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයෙහි එකතුව රු. 2,800,000 ක පස් තලන යන්ත්‍ර (Plate Compactor) 08 ක් 2007 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව විනාශ වීමට ඉඩහැර තිබුණි. මෙම යන්ත්‍ර අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මෙම යන්ත්‍ර වැඩ බිම්වලට යොදා ගැනීමේ දී වාහනවලට පැටවීම වැඩ බිම්වලට මුදාහැරීම සඳහා විශාල වශයෙන් මිනිස් ශ්‍රමය යොදා ගැනීමට සිදුවීම නිසා භාවිතයට ගැනීමේ අපහසුවිය. මින් යන්ත්‍ර 07 අපහරණය සඳහා යෝජනා කර ඇත. | වත්කම් සක්‍රීය භාවිතා කිරීමට හෝ ඒ සම්බන්ධව සුදුසු ඵලදායී ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වාහන 04 ක් අබලන් වීම හේතුවෙන් වසර දෙකේ සිට වසර 12 දක්වා කාලයක සිට භාවිතා කළ නොහැකි ලෙස ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර එම වාහන අළුත්වැඩියා නොකර අධිකාරිය විසින් කුලී පදනමට වාහන 06 ක් ලබාගෙන ඒ වෙනුවෙන් මාසිකව රු.1,212,824 ක් බැගින් වැය කර තිබුණි. | වාහන අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත්කිරීමට සුදුසු තත්ත්වයේ නොමැත. (තහවුරු නැත) අපහරණය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | වාහන සම්බන්ධව මෝටර් යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගේ නිර්දේශයන් මත කටයුතු කළ යුතුය. |
| (ඊ) | නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයකින් අනතුරුව සැලසුම් කර මුළු පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල නොකර 2018 වර්ෂයේ රු.146,971,232 කට ගම්පොල බහුකාර්යය ගොඩනැඟිල්ල ඉදි කිරීමේ ඇස්තමේන්තු පිළියෙල කර 2023 | මුළු ඇස්තමේන්තුව රු.189,793,007.13 කි ඇස්තමේන්තුව 2018 වුවද ඉදිකිරීම් ආරම්භ කිරීම 2020 විය. පැවති කොරෝණා භාණ්ඩ සහ භාණ්ඩ මිල ඉහළ යාම අත්‍යාවශ්‍ය වැඩ කොටස් ඉටු කිරීමට සිදුවීම නිසා ඇස්තමේන්තුව ඉක්මවා වැය කිරීමට සිදුවීම. | ඇස්තමේන්තුව සංශෝධනය කර අනුමත කරගත යුතුය. |

| | | |
|---|---|---|
| සැප්තැම්බර් 10 දිනට එකතුව රු.305,607,447 ක් මුදලක් වැය කර තිබුණි.ඒ අනුව ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.158,636,215 ක් ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබුණි. | | |
| (උ) 2018 ඔක්තෝබර් 18 දින මධ්‍යම පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අමාත්‍යාංශ 05 ක අමාත්‍යවරයා හා පෞද්ගලික කාර්යය මණ්ඩලය භාවිතා කළ වාහන 61 ක් ප්‍රධාන ලේකම් හා අනෙකුත් ආයතනවලට භාර දී තිබියදී එම වාහන, අවශ්‍යතාවය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට ලබා ගැනීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමකින් තොරව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එහි ප්‍රධාන /විධායක ඉංජිනේරුවරුන් සඳහා කොට්ඨාශයේ මාර්ග පරික්ෂා කිරීමේ කටයුතු සහ විවිධ රැස්වීම්වලට සහභාගි වීමට ද්විත්වකාර්ය වාහන 12 ක් 2018 සිට 2023 අගෝස්තු දක්වා කාලය තුළ කුලී පදනම මත සේවයේ යොදවා කුලී ලෙස එකතුව රු.75,092,077 ක් පෞද්ගලික පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. | වෙනත් ආයතනවල අනුයුක්ත කළ සංචිත රථ ලෙස භාවිතා කරන බව. | වියදමක් දැරීමේ දී ඒ සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ගයන් ඇගයීමට ලක් කර වඩා ඵලදායී හොඳම විකල්පය ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන හා යතුරුපැදි 03 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා කරනු ලබන මෙම වාහන පිළිබඳව විස්තර ලිඛිතව දක්වා නොමැති බැවින් එම වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොමැත. | වාහන හා යතුරුපැදි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**1.5.20 ශීර්ෂය 571 - මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිවාස දෙපාර්තමේන්තුවේ "සහන් පියස" නිවාස ණය වැඩ සටහන යටතේ ණය ලාභීන් 53 දෙනෙකුට 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබා දී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.1,504,991 ක හිඟ ණය අය කර නොතිබුණි. | 2023.12.31 දිනට ගෙවීම් පැහැරහැර ඇති ණය ලාභීන් සම්බන්ධ තොරතුරු ලබාදෙන ලෙස බැංකුවෙන් ඉල්ලීමක් කර ඇත. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1994 වර්ෂයේ සිට 2001 දක්වා වූ කාලය තුළ නිවාස දෙපාර්තමේන්තුවේ නිවාස ණය ලාභීන් 880 දෙනෙකුට ලබා දී තිබුණු රු.5,682,579 ක ණය මුදල් අය කිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම් විසින් පැවැත්වූ මූ.රේ. 104(4) පරීක්ෂණ වාර්තාව අනුව හිඟ ණය ශේෂයන් පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බව | හිඟ නිවාස ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.21 ශීර්ෂය 582 - මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ තොළඹුගොල්ල ලී වැඩ තාක්ෂණ පුහුණු ආයතනයේ දේශන ශාලාව 2016 වසරේ රු.2,384,612 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද, එදින සිට 2023 වසර අවසාන වන තෙක් භාවිතයට ගැනීමකින් තොරව ඌණ උපයෝජිතව පැවතුණි. එසේම එහි ශිෂ්‍ය නේවාසිකාගාරය හා මුළුතැන්ගෙයද, භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවති අතර වටපුළුව ලී වැඩ තාක්ෂණ පුහුණු ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවද, ඌණ උපයෝජිතව පැවතුණි. | දේශන ශාලාව විධිමත් ගාස්තු ක්‍රමයක් යටතේ බාහිර ආයතන වලට ලබාදීමට කටයුතු කරන බව. සම්මන්ත්‍රන ශාලාව දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් පවත්වන බැවින් ඌණ උපයෝජිතව නැත. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.22 ශීර්ෂය 583 - මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යම පළාත් ක්‍රීඩා විද්‍යායතනයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේ රු.2,000,000 ක් මධ්‍යම පළාත් සභාවට ලබාදී තිබුණද අරමුණුගත කාර්යට ප්‍රතිපාදන යොදවා ගැනීමකින් තොරව සම්පූර්ණ මුදලම | 2021 වසරේ බහු ක්‍රීඩා මධ්‍යස්ථාන සඳහා වෙන්කළ රු.මිලියන 03 ක ප්‍රතිපාදන සඳහා භාණ්ඩ මිලදී ගත්තද එම වර්ෂයේ මුදල් නොලැබීම නිසා මෙම මුදල් යොදාගත් බව | ප්‍රතිපාදන අදාළ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීමට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැයකර මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ බහු ක්‍රීඩා මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබාදී තිබුණි. | | |
| (ආ) | මධ්‍යම පළාත් ක්‍රීඩා සංකීර්ණයට අයත් ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.2,117,465 ක ශේෂයක් පැවතියද එම මුදල් අරමුණුගත කාර්යන්ට යොදවා ගැනීමට හෝ ඵලදායි ක්ෂේත්‍රයක ආයෝජනය කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි. | රුපියල් ලක්ෂ 50 ක මුදලක් ආයෝජනය කර ස්ථිර තැන්පතුවක් දැමීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ක්‍රීඩා දෙපාර්තමේන්තුවට අයත් වාහනයේ රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට හා ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම, ලේඛන යාවත්කාලීන කිරීම හා වාහනය තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.23 ශීර්ෂය 590 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන යටතේ රු.66,550,000 ක ප්‍රතිපාදන මඟින් වැඩසටහන් 35 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද එම එක් එක් වැඩසටහනෙහි සමාලෝචිත වර්ෂය අවසාන දිනට භෞතික ප්‍රගතිය සියයට 0 - 25 අතර අවම මට්ටමක පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 25 අතර අවම පරාස මට්ටමක පවතින බව | සංවර්ධන වැඩසටහන් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 40 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහනය පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහනය තොරතුරු නිසි පරිදි පවත්වා ගෙනයාමටත්, අදාළ තොරතුරු එක්රැස් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. |

**1.5.24 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මුල්හාල්කැලේ කෘෂිකර්ම උපදේශක නිල නිවාසය, වලපනේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ලෙස නවීකරණය කිරීම සඳහා 2021 ඔක්තෝබර් 04 දින රු.10,229,108 කට ගිවිසුම්ගත වී ඉදිකිරීම් පවරා තිබුණි. එසේ වුවද 2022 දෙසැම්බර් 15 දින වන විට වැඩ අතර මඟ නවතා තිබුණු අතර ඉටුකර තිබූ වැඩ සඳහා රු.4,094,544 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් එහි ඉදිකිරීම් අවසන්කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැය කල මුදල් නිශ්ඵල වියදම් බවට පත්වී තිබුණි. | පිළිතුරු සපයා නැත. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සැලසුම් කරනු ලබන ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය යටතේ ආරක්ෂිත ගෘහ ඉදි කිරීමෙන් පසුව ජල සම්පාදන කට්ටල ලබාදිය යුතු වුවත් එම ගෘහ ඉදිකර භාරදී නොතිබියදී පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයේ ව්‍යවසායකත්ව කෘෂි අපනයන ගම්මාන වැඩසටහන II අදියර යටතේ රඹුක්පිටිය කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 25 දෙනෙකුට රු.2,876,088 ක ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 25 ක් ලබා දීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එම ජල සම්පාදන කට්ටල නිෂ්කාර්යව පැවතුණි. | ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල ලබා දී 2024 අගෝස්තු මස වන විට වැඩසටහන ආරම්භ කරන බව | ප්‍රාග්ධන ප්‍රදානයන් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක වෙත ඵලදායීව මෙහෙයවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට වෙන්කල ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නවයාලතැන්න දිස්ත්‍රික් කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පාංශු විද්‍යාගාරය නවීකරණය සහ පාංශු පරීක්ෂණ උපකරණ සඳහා පිළිවෙලින් රු.3,000,000 ක් සහ රු.14,518,059 ක් ලෙස එකතුව රු.17,518,059 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ නොකර ඒ සඳහා සපයන ලද උපකරණ ඇසුරුම් තුළම රඳවා නිෂ්කාර්යයව පැවතුණි. | 2024 අගෝස්තු මස වන විට නිසි පරිදි පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ කරන බව | ප්‍රාග්ධන ප්‍රදාන ඵලදායීව උපයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු බව |
| (ඈ) කෘෂිකර්ම අමාත්‍යාංශය (මධ්‍යම රජය) 2022/2023 වර්ෂවල ක්‍රියාත්මක කළ කුඹුරු ඉඩම්වල පස් පරීක්ෂා කර පාංශු සෞඛ්‍ය වාර්තා ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්යභාරය ඉටුකිරීම වෙනුවෙන් එකතුව රු. 10,349,100 ක පාංශු පරීක්ෂණ කට්ටල (Soil Test Kit) 90 ක් මධ්‍යම පළාතේ පිහිටි සියලු කෘෂිකර්ම උපදේශක කාර්යාල සඳහා එක් කට්ටලයක් බැගින් බෙදා දී තිබුණද නියැදි පරීක්ෂාව අනුව නුවරඑළිය හා මාතලේ පිහිටි කෘෂිකර්ම උපදේශක කොට්ඨාශ 34 ක 2022 හා 2023 වර්ෂයන්හි පාංශු නියැදි පරීක්ෂා කිරීමේ ප්‍රගතිය පරීක්ෂණ 1 සිට 34 දක්වා අවම මට්ටමක පැවති අතර කෘෂිකර්ම උපදේශක කොට්ඨාශ 11 ක එම කාලය තුළ කිසිදු පාංශු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | නුවරඑළිය සාම්පල් 1124 ක් පරීක්ෂාකර අදාළ වාර්තා ගොවීන් වෙත යවා ඇත. මාතලේ මෙම කට්ටලය භාවිතයට ආ භූගත ජලය ලබා ගැනීමට කටයුතු කළ ද මෙතෙක් ලැබී නැත. | ප්‍රාග්ධන ප්‍රදාන ඵලදායීව යෙදවිය යුතුය. |
| (ඉ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු එකතුව රු.5,500,000 ක වාහන 2 ක් වසර 2 සිට වසර 3 කට වැඩි කාල පරාසයක් අලුත්වැඩියාවකින් තොරව කුණ්ඩසාලේ සහ නුවරඑළිය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල භූමිවල ගාල්කර තිබුණි. | වෙනත් ආයතනයක් වෙත ලබාදීමට එකඟතාවය එල කර ඇති බව. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන 28 ක රාජ්‍ය ලංඡනය යෙදීම හා වාහන බඳෙහි, ආයතනයේ නම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (උ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන හා යතුරුපැදි 03 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් ලියාපදිංචි වී පැමිණි පසුව ගිණුම්ගත කර ඇති බව | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන 06 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහන පිළිබඳ තොරතුරු නිසිපරිදි පවත්වාගෙන යාමටත් අදාළ තොරතුරු එක්රැස් කර ගැනීමටත්, කටයුතු කළ යුතුය. |

**1.5.25 ශීර්ෂය 592 – පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවශ්‍යතාවය නිශ්චිතව හඳුනානොගෙන පශු රෝහල සහ පශු වෛද්‍ය කාර්යාලවල ප්‍රතිකාර සඳහා ඉකුත් වර්ෂයේදී එකතුව රු.2,383,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු Scalp Vein Set (Butterfly needles 100N) 22,700 කින් එකතුව රු.1,810,200 ක කට්ටල 17,240 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පළාත් අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ අතිරික්තව පැවතුණි. | 2022 වර්ෂයේ ඉදිරිපත් වූ අවශ්‍යතාවය 2027 ක් වේ. මෙම ඖෂධයන් කල් ඉකුත් වීමේ දිනට 2027 බැවින් ගබඩාවේ පවතින තොගයන් අවශ්‍යතා අනුව නිකුත් කරමින් පවතී. | තොග අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රශස්ථ තොග කළමනාකරණයක් ආයතනය තුළ ස්ථාපිත කළ යුතුය. |
| (ආ) පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව 2020 වර්ෂයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා කාල පරාසය තුළ මධ්‍යම | උෂ්ණත්වය රෝගී තත්ත්වය, ගබ්සාවීම් ගැබ්ගත් සතුන් විකිණීම, අර්ථ සූක්ෂම හෝ නිදැලි ක්‍රමය යටතේ සතුන් එහා මෙහා ගෙන යාම, පිරිමි පැටවුන්ගේ උපත් වාර්තා | කෘතිම සිංචන සාර්ථක කර ගැනීමට කටයුතු කිරීම සඳහා විධිමත් |

| | | | |
|---|---|---|---|
| | පළාතේ පශු වෛද්‍ය කොට්ඨාශ 44 හි සත්ව සංවර්ධන උපදේශකවරුන් හා පෞද්ගලික කෘතිම සිංචන ශිල්පීන් විසින් කෘතිම සිංචන 156,128 ක් සිදු කර තිබුණද ඉන් උපත් පැටවු ගණන 46,208 ක් වූයෙන් එය මුළු කෘතිම සිංචන ප්‍රමාණයෙන් සියයට 30 ක අවම ප්‍රතිශතයක් විය. ඒ අනුව කෘතිම සිංචන 109,920 ක් අසාර්ථක වී තිබුණු අතර එය සියයට 70 ක ප්‍රතිශතයක් විය. | නොවීම, ගැබ් ගන්නා කාලය තුළ සතුන් නිවැරදිව බලා නොගැනීම වැනි විවිධ හේතූන් නිසා ශ්‍රී ලංකාවේ කෘතිම සිංචනවල සාර්ථකත්වය සියයට 50 කි. සිංචන ශිල්පීන්ගේ අවධානය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් පසුවිපරම් ක්‍රියාවලිය කෙරෙහි අවධානය ඉදිරියේ දී යොමු කරන බව. | තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සත්ව අභිජනන කටයුතු සංවර්ධනය තුලින් කෘෂිකාර්මික සතුන්ගේ නිෂ්පාදන දායකත්වය ඉහළ නැංවීම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද 2020 වර්ෂයේ මධ්‍යම පළාතේ ලියාපදිංචි වී තිබුණු සමස්ත ගොවිපල් සංඛ්‍යාව 38,081ක් පැවතියද 2022 වර්ෂය වනවිට ගොවිපල් 31,344 ක් දක්වා 6,737කින් අඩුවී තිබුණු අතර එම කාලයට අදාළව ඉන් දේශීය කිරි නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වය දරන එළගව හා මීගව ගොවිපල් සංඛ්‍යාව 6441කින් එනම් සියයට 17කින් අඩුවී තිබුණි. එසේම 2020 වර්ෂයේ 100,423 ක්වූ සත්ව ගහනය 2022 වර්ෂයේදී 82,228 ක් දක්වා 18,195කින් පහළ ගොස් තිබීම කිරි නිෂ්පාදනය අඩු වීමට බලපා තිබුණි. 2020 සිට 2022 දක්වා පශු සම්පත් ක්ෂේත්‍රයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.123,163,160 ක් වැය දරා තිබුණද ගොවීන් විශාල සංඛ්‍යාවක් සත්ව පාලනයෙන් බැහැර වී තිබුණි. | ආරථික අර්බුධකාරී තත්ත්වය ඉවත්වීමත් සමඟ මෙම තත්ත්වය යථාතත්ත්වයට පත්වීමේ හැකියාව ඇත. දෙපාර්තමේන්තුව විසින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ඵලදායීව යෙදවිය යුතු අතර පසුවිපරම් කටයුතු විධිමත්ව සිදුකළ යුතු බව. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ට අයත් වාහන 03 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලය තුළ සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන හා යතුරුපැදි 03 ක් සම්බන්ධයෙන් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර එම වාහන වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය මගින් ලබාගත් තක්සේරු වාර්තාව ඉදිරිපත් කර ඇත. | ලේඛන යාවත්කාලීන කර වාහන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පශු වෛද්‍ය කාර්යාල 07 කට අයත් වාහන 07 ක් අනතුරට භාජනය වී, අළුත්වැඩියා කිරීමකින් තොරව අදාළ පශු වෛද්‍ය කාර්යාල වල ගාල්කර තිබුණි. | වාහන 01 ක් අළුත්වැඩියා කර භාවිතයට හෝ වෙනත් ආයතනයක් වෙත ලබා දීමට සහ වාහන 01 ක් භාවිතයෙන් ඉවත් කිරීමට අපහරණ කමිටුව නිර්දේශ කර ඇත. වාහනයක් අළුත්වැඩියාව සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති අතර, වාහන 01 ක් අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. වාහන 03 ක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇත. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි වාහන අළුත්වැඩියා කිරීමටත් අනෙකුත් වාහන සම්බන්ධයෙන් අපහරණ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතීන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන 09 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණු අතර එම වාහන මධ්‍යම පළාත් සභාවේ ආයතන විසින් භාවිතා කරන බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | තොරතුරු සොයාබලා වාර්තා කරන බව | වාහන පිළිබඳ තොරතුරු නිසි පරිදි පවත්වාගෙන යාමටත්, අදාළ තොරතුරු එක්රැස් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.26 ශීර්ෂය 593 – පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 05 දරන මධ්‍යම පළාත් සභාවේ වාරිමාර්ග ප්‍රඥප්තියේ II කොටසේ 7(5) වගන්තිය සහ 7(7) ඡේදය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්වන සියලුම වාරි ක්‍රමවල ලැයිස්තුවක් සකස්කර රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර වාරි කළමනාකරණ ප්‍රාදේශීය බල මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රඥප්තියේ iii වන කොටසේ 12 ඡේදය අනුව වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු වල (අ) - (ඔ) දක්වා වූ කාර්යභාරය කිරීමට නොහැකිව තිබුණි. | උඩතැන්න වැව අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. මධ්‍යම පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය අනුව සුළු වාරිමාර්ග ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීම අවශ්‍ය නැති බව. ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට කාර්ය මණ්ඩලය ප්‍රමාණයවත් නොවන බව. | ප්‍රඥප්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |